# ඇමෙරිකානු තානාපති කාර්යාලය, කොළඹ

## භාරකරු [ස්ත්‍රී/පුරුෂ]

**කොළඹ ඇමෙරිකානු තානාපති කාර්යාලය විසින් පහසුකම් කළමනාකරණ කාර්යාලය සඳහා භාරකරු තනතුරට සුදුසුකම් ලත් අයදුම්කරුවන්/කාරිනියන් බඳවා ගනු ලැබේ.**

**ස්ත්‍රී සහ පුරුෂ දෙපාර්ශවයම මෙම තනතුර සඳහා අයදුම් කරනු ඇතැයි අපේක්ෂා කරමු. ඇමෙරිකානු තානාපති කාර්යාලය ජාතිය, වර්ණය, ආගම, ලිංග භේදය, ජාතිකත්ව සම්භවය, වයස, ආබාධිතභාවය, දේශපාලන පක්ෂපාතීත්වය, විවාහක / අවිවාහක බව හෝ ලිංගිකත්ව අභිමතය යන කරුණු නොසලකන අතර මානව විවිධත්ව ශ්‍රම බලකායක් යටතේ සමාන අවස්ථා වෙනුවෙන් කටයුතු කරනු ලබයි. ඔබගේ මනුෂ්‍යත්වය සහ යහපත්කම යන ගතිගුණ අපි ඉතා අගය කොට සලකමු. අන් ලාංකිකයන්ට වඩා, ඔබගේ මහාව වැඩ කිරීමේ හැකියාව අපගේ අපේක්ෂාවයි. මේ සඳහා ඔබගේ ලිංගික සම්භවය, ආගමික සම්භවය හෝ දේශපාලන අභිමතය නොසලකමු.**

මෙම තනතුර දරන්නා දෙන ලද උපදෙස් පරිදි තානාපති කාර්යාල පරිශ්‍රයන්හි මෙන්ම ඇමෙරිකානු රජයට අයත් නේවාසික හෝ කල්බදු පදනම යටතේ පවතින දේපළවල විවිධාකාරයේ පිරිසිදු කිරීමේ කටයුතු සිදුකළ යුතු වේ.

**පූර්ණ කාලීනව සතියකට පැය 40ක සේවා කාලයක් සහිත මෙම තනතුර සඳහා මාසික දළ වැටුප ඇමෙරිකානු ඩොලර් 278.66 කි.**

කාර්යමණ්ඩල වේතන ඇමෙරිකානු ඩොලර් මඟින් නම් කර ඇති අතර ගෙවීම් කාල සීමාවේ පවතින විනිමය අනුපාතයන්ට අනුව රුපියල් වලින් ගෙවීම සිදු කෙරේ. 2023 මාර්තු 28 වනදා වන විට විනිමය අනුපාතය ඇ.ඩො.1 = රු. 320.00 කි. මෙය තානාපති කාර්යාලයේ දේශීය ප්‍රතිපූරණ සැලැස්මේ තාවකාලික සංශෝධනයක් වන අතර අනිවාර්ය අයිතියක් නොවේ.

**<u>සම්පූර්ණ කළ යුතු සුදුසුකම්:</u>**

1. **අධ්‍යාපන** - ප්‍රාථමික අධ්‍යාපනය සම්පූර්ණ කර තිබීම *(සාමාන්‍ය පෙළ විභාගයේ අත්‍යවශ්‍ය විෂයයන් සියල්ලම හෝ අවම වශයෙන් අඩක්වත් (50%) සඳහා පෙනී සිටීම අවශ්‍ය වේ).* **(අදාළ අධ්‍යාපන සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය).**

2. **පූර්ව රැකියා පළපුරුද්ද** - අවම වශයෙන් මාස හයක භාරකරු හෝ ගෘහ සේවක තනතුරක පළපුරුද්ද තිබිය යුතු ය. **(අදාළ සේවා ආයතනයේ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය).**

3. **භාෂා ප්‍රවීණතාවය** - I වන මට්ටමේ (ප්‍රාථමික දැනුම) ඉංග්‍රීසි භාෂාව කියවීම සහ කථා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ. **(මෙය පරීක්ෂා කරනු ලැබේ).**
   එසේම II වන මට්ටමේ (සීමිත දැනුම) සිංහල හෝ දෙමළ කියවීම සහ කථා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ.

4. **නිපුණතා සහ හැකියාවන්** - කාය ශක්තියෙන් කළ හැකි මූලික වැඩකටයුතු කිරීමේ හැකියාව මෙන්ම, පිරිසිදු කිරීමේ උපකරණ සහ මෙවලම් ආරක්ෂාකාරීව භාවිතයේ හැකියාව තිබිය යුතු ය. **(සුරක්ෂිතව රිය පැදවීමේ හැකියාව පරීක්ෂා කළ හැක).**

**<u>අයදුම් කරන ආකාරය :</u>**

ඔබගේ අයදුම්පත ඉලෙක්ට්‍රොනික බඳවාගැනීමේ යෙදවුම් පද්ධතිය **[ERA]** හරහා ඉදිරිපත් කිරීම සඳහා කරුණාකර අපගේ වෙබ් අඩවිය වන **https://lk.usembassy.gov/embassy/jobs/** වෙත පිවිසෙන්න. ඔබ විසින් අදාළ අයදුම්පත් ඉදිරිපත් කිරීමට පෙර අපගේ වෙබ් අඩවියේ සඳහන් කර ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

<u>අවශ්‍ය ලේඛන:</u>

මෙම තනතුර සඳහා අයදුම් කිරීමට, අයදුම්කරුවන් විසින් **විද්‍යුත් අයදුම්පත සමඟ පහත ලේඛනවල විද්‍යුත් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.** එසේ කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් මෙම රැකියා අවස්ථාව සඳහා සුදුස්සන් නොවන බවට සලකනු ලැබේ.

- අදාළ අධ්‍යාපන සහතික
- අදාළ සේවා/කාර්යය පළපුරුද්ද පිළිබඳ සහතික
- පුරවැසිභාවය සනාථ කිරීමේ ලියවිලි (ජාතික හැඳුනුම්පත/විදේශ ගමන් බලපත්‍රය සහ/හෝ වැඩ බලපත්‍ර)

**<u>තැපැල් හෝ විද්‍යුත් මඟින් එවනු ලබන අයදුම්පත් භාරගනු නොලැබේ.</u>**

ඔබගේ අයදුම්පත 2023 **අප්‍රේල් 14** වන දින හෝ ඊට පෙර අප වෙත ලැබෙන්නට සලස්වන්න.
තෝරාගනු ලබන අයදුම්කරුවන් පමණක් කැඳවන බව කාරුණිකව සළකන්න.